0 15

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන - 2022/2023

අවසාන පරීක්ෂණය - 2023

**SNP8247/SNP8237** - පුනරුත්ථාපනය හා ප්‍රජාමූලික පුනරුත්ථාපනය

කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2023.12.17 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්න වලටද 2 වන කොටසින් ඕනෑම ප්‍රශ්න තුනකටද (3) පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. ලෝක සෞඛ්‍ය සංවිධානයට අනුව ( WHO ) 1980 වර්ෂයේදී බාධිත බව නිර්වචනය කර ඇති ආකාරය පැහැදිලි කරන්න.

02. දුබලතාවය පිලිබඳ සමාජ ආකෘතිය තුළ ඔබ නිරීක්ෂණය කරන ලක්ෂණ පහක් (05) සඳහන් කරන්න.

03. දුබලතාවය පිලිබඳ සමාජයේ පවතින පොදු මිත්‍යාවන් පහක් (05) ලැයිස්තු ගත කරන්න.

04. දුබලතාවය සහිත දරුවකු වෛද්‍ය ආකෘතිය තුළ හඳුනා ගන්නා ආකාරය සුදුසු උදාහරණ පහක් (05) සමගින් පැහැදිලි කරන්න.

05. ශ්‍රී ලංකාවේ දුබලතා සහිත දරුවන්ට බලපාන නීති හතරක් (04) ලැයිස්තු ගත කර ඉන් එක් නීතියක් උදාහරණයකින් පැහැදිලි කරන්න.

06. විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය සඳහා වැදගත් වන ජාත්‍යන්තර ප්‍රකාශ සහ සම්මුතීන් පහක් (05) සඳහන් කරන්න.

07. දුබලතා සහිත පුද්ගලයන් සඳහා වූ අධ්‍යාපන පනත (IDEA) හි මූලධර්ම හයක් (06) සඳහන් කර එම එක් මූලධර්මයේ අවශ්‍යතාය පැහැදිලි කරන්න.

08. “ප්‍රජාමූලික පුනරුත්ථාපනය” (CBR) වැඩසටහන තුළ දුබලතා සහිත පුද්ගලයන් සවිබල ගැන්වීමේ ප්‍රවේශ පහක් (05) නම් කරන්න.

(ලකුණු 5x 8 = 40)

<u>2 වන කොටස</u>

09. (i) "ප්‍රජා මූලික පුනරුත්ථාපනය" ( CBR ) යන යෙදුම ඔබේ වචන වලින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) තිරසාර ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවර විශ්ලේෂණය කරන්න. (ලකුණු 05)

(iii) ශ්‍රී ලංකා සන්දර්භයට ගැලපෙන ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසහටක් ඔබ ප්‍රායෝගිකව සුලසුම් කරන්නේ කෙසේදැයි සුදුසු උදාහරණ සහිතව නිර්මාණශීලීව ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

10 (i) දුබලතා සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය (UNCRPD) තුළින් දුබලතා සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් සහ ගෞරවය ආරක්ෂා කිරීම අරමුණු කරයි.
ශ්‍රී ලංකාවේ තත්ත්වය තුළ දුබලතා සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියේ (UNCRPD) අරමුණ, අර්ථ දැක්වීම සහ පොදු මූලධර්ම යන කරුණු එහි මුල් වගන්ති තුනට අනුව විශ්ලේෂණය කරන්න. (ලකුණු 06 )

(ii) ඉහත සම්මුතියේ 24 වැනි වගන්තිය යටතේ දුබලතා සහිත පුද්ගලයන්ගේ "අධ්‍යාපනය" රාජ්‍ය පාර්ශවයන් විසින් සහතික කරන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) ඉහත සම්මුතියේ වගන්ති අංක 24 ට අදාළව ශ්‍රී ලංකාව තුළ හඳුනාගත හැකි ගැටළු විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න. (ලකුණු 08)

11. (i) ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහනේ (CBR) ප්‍රජා සහභාගීත්වය යනු කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) විශේෂ අවශ්‍යතා සහිත දරුවන් පුනරුත්ථාපනය කිරීමේදී පවුලේ කාර්යභාරය පරීක්ෂා කරන්න. (ලකුණු 07)

(iii) ප්‍රජා සහභාගීත්වයේ අත්‍යවශ්‍ය ලක්ෂණ උදාහරණ සමගින් අගයන්න. (ලකුණු 08)

12 (i) උත්තාපනයේ හා පුනරුත්ථාපනයේ වෙනස සුදුසු උදාරණ සමගින් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(ii) පුනරුත්ථාපනයට ලක්වන පුදුගලයින් තුළ ක්‍රියාකාරීත්වයේ ස්වාධීනත්වය ප්‍රවර්ධනය කිරීම සහ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා භාවිතා කරන විශේෂිත මැදිහත්වීමේ හෝ ශිල්පීය ක්‍රම පිළිබඳ උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 07)

(iii) සමාජයේ දුබලතා සහිත පුද්ගලයින්ගේ ආකල්ප සම්බන්ධයෙන් ඇතිවන ගැටලු මගහරවා ග්ත හැකි ක්‍රම හතරක් (04) යෝජනා කරන්න. (ලකුණු 08)

13 (i) දුබලතා සහිත් පුද්ගලයින්ගේ සංවිධානය (DPOs) යනු කුමක්ද? දුබලතා සහිත පුද්ගලයින්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා වගකීම් සහ ක්‍රියාදාමයන් විස්තර කරන්න්න.

( ලකුණු 05)

(ii) ස්ව සහයක කණ්ඩායම් වල (SHGs) ලක්ෂණ පහක් (05) පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(iii) දුබලතා සහිත පුද්ගලයින් සඳහා පුනරුත්ථාපන ක්‍රියාවලියේ දී දේශපාලන සහභාගිත්වයේ දිගු කාලීන ප්‍රතිඵල හතරක් (04) උදාහරණ සමගින් පරීක්ෂා කරන්න.

ලකුණු 10)

14 (i) දුබලතා සහිත් පුද්ගලයින් සඳහා වූ අධ්‍යාපන පනත (IDEA) සහ එක්සත් ජනපදයේ 1973 පුනරුත්ථාපන පනතේ 504 වගන්තිය යටතේ දුබලතා සහිත දරුවන් සඳහා සේවා සපයයි. එක්සත් ජනපදයේ 1973 පුනරුත්ථාපන පනතේ 504 වන වගන්තියේ වැදගත්කම් තුනක් (03ක්) පැහැදිලි කරන්න.

(ලකුණු 05 )

(ii) දුබලතා සහිත දරුවන් පුනරුත්ථාපනය කිරීමේ දී පාසලේ කාර්යය භාරය පරීක්ෂා කරන්න.

(ලකුණු 07 )

(iii) දුබලතා සහිත දරුවන් පුනරුත්ථාපනය කිරීමේ දී සාමාන්‍ය පන්ති කාමර ගුරුවරයාගේ කාර්යය භාරය අගයන්න.

(ලකුණු 08)

හිමිකම් ඇව්රිණි.